# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1762/40 - 2012 ජුනි මස 15 වැනි සිකුරාදා - 2012.06.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනය**

රේගු ආඥාපනත

**6අ වගන්තිය**

***ගුවන්තොටුපලෙහි දී මැණික් පාර්සල නිශ්කාෂණය කර ගැනීමේ විශේෂ සේවාව සඳහා ගාස්තුවක් ගෙවීම***

ගරු මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලද නියමයක් අනුව ගුවන්තොටුපලෙන් පැමිණෙන ගුවන් මගියෙකුට, තමා රැගෙන ආ මැණික් පාර්සල් නිශ්කාෂණය කිරීමේදී, 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනත මගින්, සංශෝධිත රේගු ආඥා පනතෙහි (235 අධිකාරය) 6අ (අ) වගන්තියෙහි අර්ථය යටතෙහි රේගු අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් සම්පාදනය කරන ලද විශේෂ කාර්යය පරිපාටියක් යටතේ නිශ්කාෂණය කිරීමේ අවස්ථාව සැලසීමට තීරණය කර තිබේ.

එබැවින් 235 වැනි අධිකාරය වන රේගු ආඥා පනතේ 6අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රේගු අධ්‍යක්ෂ ජනරාල් නෙවිල් ගුණවර්ධන වන මම, 2012.06.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගුවන් මගියෙකු විසින් ඉදිරිපත් කරනු ලබන සෑම රේගු භාණ්ඩ ප්‍රකාශනයක් (CusDec) සඳහාම ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් 200 (US $ 200) කට සමාන වූ මුදලක් ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවිය යුතු බව මෙම නිවේදනය මගින් නිශ්චය කර සිටිමි.

ආචාර්ය නෙවිල් ගුණවර්ධන,
රේගු අධ්‍යක්ෂ ජනරාල්.

2012 ජුනි මස 15 වැනි දින,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ 11,

06-1165


1A - G 016212 — 385 (2012/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.